# ඉන්දු-ලංකා ගිවිසුම සහ විප්ලවවාදී කොමියුනිස්ට් සංගමයේ කර්තව්‍යයෝ

## Indo-Lanka Accord and the Tasks of the Revolutionary Communist League

**හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශය**
**1987 නොවැම්බර් 19**

*පහත පල වන්නේ එවක ඉන්දියානු අගමැති රජීව් ගාන්ධි සහ ශ්‍රී ලංකාවේ ජනාධිපති ජේ.ආර්. ජයවර්ධන විසින් 1987 අගෝස්තු මස කොලඹ දී අත්සන් කරන ලද ඉන්දු-ලංකා ගිවිසුම සම්බන්ධයෙන් හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව විසින් නිකුත් කරන ලද ප්‍රකාශය යි. ජාත්‍යන්තර කමිටුවේ න්‍යායික සඟරාව වන ෆෝර්ත් ඉන්ටර්නැෂනල් හි ද එහි ශ්‍රී ලංකා ශාඛාව වූ විප්ලවවාදී කොමියුනිස්ට් සංගමයේ (විකොස) (වත්මන් සමාජවාදී සමානතා පක්ෂයේ පූර්වගාමියා) කම්කරු මාවත හා තොලිලාලර්පාතෙයි පත්‍රවල ද එකල මෙම ප්‍රකාශය පල විය. 1968 විකොස ආරම්භයේ සිට ම 1987 දෙසැම්බර් 18 දා හදිසි හෘදයාබාධයකින් මිය යන තෙක්ම එහි ප්‍රධාන ලේකම්ව සිටි කීර්ති බාලසූරියා සහෝදරයා මෙම ප්‍රකාශය කෙටුම්පත් කිරීමෙහි ලා ජාත්‍යන්තර කමිටුවේ සෙසු නායක සහෝදරවරු සමග ඒකාබද්ධ විය.*

1. ඉන්දු-ලංකා ගිවිසුම අත්සන් කිරීම ද ශ්‍රී ලංකාවේ උතුරු හා නැගෙනහිර පලාත් ඉන්දියානු හමුදා විසින් ආක්‍රමනය කරනු ලැබීම ද මේ සියවස තුල පසුගාමී රටවල ජාතික ධනේශ්වරයේ ද්‍රෝහී, ප්‍රතිගාමී ස්වභාවය පිලිබඳව පීඩිත ජනතාවන් දැනට මත් ලබා ඇති අප්‍රමාන ඛේදජනක අත්දැකීම් සම්භාරයට තවත් එකක් එකතු කරමින් ඔවුන්ට තවත් කටුක පාඩමක් සපයා දී ඇත.

ජයවර්ධනගේ හා ගාන්ධිගේ ක්‍රියාවන්හි යම් සුවිශේෂත්වයක් පවත්නේ නම්, ඒ ඔවුන් දෙදෙනා තම ඒකාබද්ධ කුමන්ත්‍රනය ක්‍රියාත්මක කල නරුම භාවයේ ද නිර්දය භාවයේ ද ප්‍රමානය අතින් පමනි. මෙම මිනීමරුවන් දෙදෙන ජාතික ධනපති අධම පෙලැන්තිය තුල අමරනීය අධිරාජ්‍ය ගැත්තන් වන චියැං කායි-ෂෙක්, සදාත් හා මොබුටු වැන්නන් සමග සම තත්ත්වයක් දිනා ගෙන ඇත. ඉන්දියාවේ ද ශ්‍රී ලංකාවේ ද ධනපති පන්තියට අනාගතයේ දී තම දෙරටේ ප්‍රගතිය උදෙසා මොන යම් මැ හෝ ප්‍රගතිශීලී කාර්ය භාරයක් ඉටු කිරීමට තිබේ ය යන වංචාවේ නූල් පටක් හෝ ඉතිරිව තිබුනේ නම් දැන් ඒ සියල්ල ජයවර්ධනගේ හා ගාන්ධිගේ පිලිවෙත්වලින් සුනු විසුනු වී ගොස් තිබේ.

2. දශක ගනනාවක් තිස්සේ ගාන්ධිවාදය යැයි නම් කෙරුනු ඓතිහාසික වැරදි වැටහීමේ අනුහස සොරකම් කර ගත් කොන්ග්‍රස් පක්ෂයේ මිනී මෝරු, තම දූෂිත භාවය වසන් කර ගැනීම සඳහා, 'මහත්මාගේ' කපටි දේශපාලන බක තපස කෙරේ ජනතාව තුල පැවති වික්ෂිප්ත, බොලඳ ගෞරවය ගසා කෑහ.

ලෝකයේ හතර වන තැන දරන ධනේශ්වර හමුදාව යොදා ගෙන දකුනු ආසියාවේ අධිරාජ්‍යවාදී අවශ්‍යතා ආරක්ෂා කරමින් තමන්ගේ ම රටේ කෙල ගනන් පීඩිත ජාතීන්ගේ ප්‍රජාතන්ත්‍ර අභිප්‍රායන් පයින් පෑගූ ඉන්දියානු ධනේශ්වර පන්තිය එම මෘග මර්දනය වසන් කිරීම සඳහා "නොබැඳි" යහගුන කාමයේ වෙස් මුහුන යොදා ගත්හ.

ජාතික විමුක්තිය සඳහා කල අරගලයක කීර්ති නාම මාත්‍රයකට හෝ උරුමයක් නැති ශ්‍රී ලංකාවේ ධනපති පන්තිය තම අධිකාරයට යුක්ති සම්පාදනය කර ගැනීමට භූගෝලීය අහඹු ද, දුටුගැමුනු හා පරාක්‍රමබාහු පිලිබඳ ගූඪ ජනප්‍රවාදයන් ද පිටුපස වියරු ලෙස දිව ගියහ.

3. 1948 දී වතු කම්කරුවන්ගේ පුරවැසි අයිතිවාසිකම් පාගා දැමීම ද 1956 දී දෙමල භාෂාවට සම තැන් දීම ප්‍රතික්ෂේප කිරීම ද කල තැන් පටන් 1983 දෙමල විරෝධී සංහාරයත් ඉක්බිතිව උතුරු-නැගෙනහිර පලාත් ආක්‍රමනය කිරීමත් දක්වා ස්වකීය දුෂ්ට ලේ වැකි වාර්තාව වසන් කිරීම සඳහා ශ්‍රී ලංකාවේ ධනේශ්වර පන්තිය තමන් ඒකීය රාජ්‍යය ආරක්ෂා කරන්නේ ය යන බිඳුනු තැටිය යලි යලිත් වාදනය කලහ. ඔවුහු දෙමල ජනයාට එරෙහි යුද්ධයට මහජන සහයෝගය වගා කර ගැනීම සඳහා සිංහල වර්ගයා ඉන්දියානු "ව්‍යාප්තවාදයට" එරෙහිව අවසන් සටනේ නිරත වී සිටිතැයි කියමින් අතිශය පසුගාමී පරහීතික

හැඟීම් ඇවිස්සූහ. යූඇන්පිය හා ශ්‍රීලනිපය යන ප්‍රධාන ධනේශ්වර පක්ෂ දෙක ම, ගම්බද ජනතාවගේ මූලික ජීවිතාවශ්‍යතාවන් වැඩි වැඩියෙන් උදුරා ගනුත් ගනුත් එම ජනතාවට දෙමල විරෝධී වර්ගවාදයේ හලාහල විෂ ද වැඩි වැඩියෙන් පෙවීමට උත්සාහ කලහ.

4. මේ අතරතුරේ, නව දිල්ලියේ කූට කුමන්ත්‍රනකරුවෝ ශ්‍රී ලංකාවේ දෙමල ජනතාවගේ දුක් කම්කටොලු පිලිබඳ තම කිඹුල් කඳුලුවලින් ලෝකය රවටමින් සිංහල හමුදාවේ ජන ඝාතනයට එරෙහිව දෙමල ජනයාගේ ආරක්ෂකයන් ලෙස පෙනී සිටිමින් ව්‍යාජ ශුද්ධවන්ත භාවයක් මවා පෙන්වූහ. ඔවුහු ඒ සමග ම දෙමල විමුක්ති ව්‍යාපාරයේ පිලිවෙත් තීන්දු කිරීමේ පරම නිෂේධ බලය තමන්ට ම ඉල්ලා සිටියහ.

5. එහෙත් දැන්, අවසානයේ දී, මෙම වංචනික රඟපෑම්වලට පිටුපසින් පැවති මනීමරු පන්ති අවශ්‍යතා ඇස් නිලංකාර කරන දීප්තියකින් එලිදරව් වී තිබේ. ජයවර්ධන සිංහල ජාතික ස්වෛරීත්වය ආරක්ෂා කිරීම මෙන් ම ගාන්ධි දෙමල ස්වාධීනත්වය රැකීම ද යන මේ දෙක ම දැන් පෙරලී ඇත්තේ, ඔවුන් දෙදෙනා විසින් ආරක්ෂා කරනු ලබන බව කියූ ජන කොටස් දෙකට ම එරෙහිව ඔවුන් දෙදෙනා විසින් මෙහෙයවුනු ඒකාබද්ධ මිලිටරි ප්‍රහාරයක පිලිකුල් සහගත දර්ශනයකට ය. ජයවර්ධන අවිනිශ්චිත කාල සීමාවකට ශ්‍රී ලංකාවේ උතුරු හා නැගෙනහිර පලාත් ඉන්දියානු හමුදාවට පවරා දී ඇත. උතුරු පලාත්වල දෙමල ජනයා සමූල ඝාතනය සඳහා සතර වසරක් තිස්සේ ක්ෂේත්‍රගත කොට තිබුනු ශ්‍රී ලංකා යුද හමුදාව දැන් දකුනු පලාත්වල දුප්පත් සිංහල කම්කරුවන් හා ගොවීන් පීඩාවට පත් කිරීම සඳහා එම ප්‍රදේශවලට යවනු ලැබ ඇත. ඉන්දියානුවන් ගැන කීවොත්, ඔවුන්ගේ දෙමල ජන ආරක්ෂනය දැන් දෙමල ජන සංහාරයක් බවට ඉබේට ම පෙරලී තිබේ. ඉන්දියානුවන්ගේ ක්‍රියා අප මනසට නගන්නේ වියට්නාමයේ හුවේ නගරය සමතලා කිරීම යුක්ති යුක්ත කරමින් ඇමරිකානු ජනරාල්වරයෙකු කී කතාව යිඃ එනම්, "නගරයක් ගලවා ගැනීම සඳහා එය විනාශ කල යුතු අවස්ථා ද ඇත" යන්න යි. ජාතියක් " මුදා ගැනීම" සඳහා එහි ජනයා වනසා දැමිය යුතු ය යි ඉන්දියානු ධනපතියෝ යෝජනා කරති.

6. ශ්‍රී ලාංකික ධනේශ්වරයේ ක්‍රියාවන්ට බොහෝ ඓතිහාසික පූර්වාදර්ශ ඇත. මෙහි ලා අතිශය උචිත සාදෘශ්‍යය නම්, 1871 දී ප්‍රන්ස ධනේශ්වර පන්තිය සන්නද්ධව නැගී සිටි පැරිසියේ කම්කරු පන්තිය මැඩ ලීමට ප්‍රසියානු හමුදාව සමග සහයෝගී වූ ආකාරය ද, ඉන් 46 වසරකට පසු, බොල්ශේවික් විප්ලවය වලක්වා ලීම සඳහා පෙට්‍රොග්‍රෑඩය ජර්මානුන්ට පාවා දීමට කෙරෙන්ස්කි කල කුමන්ත්‍රනය ද වේ.

ජයවර්ධනගේ ද්‍රෝහිත්වයේ පාඩම වන්නේ ජාතික ධනේශ්වරයේ "දේශප්‍රේමීත්වයට" මොන ම ඓතිහාසික හරයක් වත් නොමැති බවත් සෑම විට ම එය ධනේශ්වරයේ සාරභූත පන්ති අවශ්‍යතාවන්ට හුදු තුනී ආවරනයක් පමනක් වන බවත් ය. දැන් ශ්‍රී ලංකාවේ ධනේශ්වර පාලනය රැඳී පවත්නේ උතුරේ ඉන්දියානු ආක්‍රමනය ද දකුනේ දෙමල විරෝධී වර්ගවාදය ද යන දෙබිඩි කුලුන මත යි. මෙම තත්ත්වයෙන් උද්දීපනය කෙරෙන්නේ, ඕනෑ ම රටක් තුල සියලු ජාතික, වාර්ගික සහ ආගමික කන්ඩායම්වල ප්‍රජාතන්ත්‍රවාදී සමානතාව දිනා ගත හැකි එක ම මග නම්, කම්කරු පන්තිය විසින් නායකත්වය දෙනු ලබන සමාජවාදී විප්ලවය බව ය.

7. ගාන්ධිගේ හා ජයවර්ධනගේ කුමන්ත්‍රනය ඉන්දියානු උපමහාද්වීපයේ ජාතික ධනපති පන්තීන්ගේ මෘග ස්වභාවය එලිදරව් කර ඇති අතර ම ජාතික ස්වයං නිර්නය අත් කර ගැනීමට අසමත් සුලු ධනේශ්වර ජාතිකවාදයේ බංකොලොත් බවත් මෙම අලුත් ම ඓතිහාසික අත්දැකීමෙන් එලිදරව් වී තිබේ. මුලු මහත් ජනතාවන්ගේ ඉරනම පරදුවට තැබී ඇති මෙබඳු තත්ත්වයක දී භාවාතිශයත්වයට ඉඩ නැත. එල්ටීටීඊ සංවිධානය පත් වී ඇති දුෂ්කර තත්ත්වය ද එහි සටන්කරුවන්ගේ ඉරනම පිලිබඳව ද අප දක්වන සානුකම්පික අවධානය තිබිය දී ම, අපි කිව යුත්ත නො වලහා කියමුඃ 1987 ජුලි 29 දා පටන් ජාතික සටන මුහුන පෑ බරපතල පසුබෑම්වලට ප්‍රධාන වගකීම පැවරෙන්නේ එල්ටීටීඊ සංවිධානයේ උර මතට ය.

8. නව දිල්ලියට ගුවනින් ගොස් ඉන්දු-ලංකා සම්මුතියේ කොන්දේසිවලට එකඟ වීමට තමන් ගත් තීන්දුවට හේතු වූයේ ඉන්දියානු ගැට හා රැවටිලි ය යි ප්‍රභාකරන් දැන් කියා සිටී. මෙම "බොරු සමාව" එලිදරව් කරන්නේ එල්ටීටීඊ සංවිධානයේ බොලඳකම පමනක් නො ව සුලු ධනේශ්වර ජාතිකවාදයේ දේශපාලන ධ්වජ භංගය ද වේ. ගාන්ධි එල්ටීටීඊ නායකයා රැවටීමට සමත් වී නම්, ඒ එසේ වූයේ, එල්ටීටීඊයේ මුලු මහත් ප්‍රතිපත්තිය ඉන්දියානු ධනේශ්වරයේ සහායෙන් දෙමල ඊලම්හි ස්වයං නිර්නය අත් කර ගැනීම පදනම් කොට ගත් හෙයිනි. භයානක ප්‍රතිවිපාක ලබා දුන් මෙම සාවද්‍ය තක්සේරුවේ මූලාශ්‍රය පවත්නේ ධනේශ්වර ජාතිකවාදයේ සාරභූත පන්ති ඉදිරි දර්ශනය හා ක්‍රියා මාර්ගය තුල ය.

අවුරුදු 70කටත් වැඩි කාලයකට පෙර ලෙනින් අනතුරු හැඟවූ පරිදි පීඩිත ජාතියක ධනේශ්වර පන්තිය තම ස්වයං නිර්නය යන්නෙන් අදහස් කර ගන්නේ ම තමන් සඳහා ජාතික වරප්‍රසාද ලබා ගැනීම ද "ස්වාධීන" රට තුල කම්කරුවන් හා ගොවීන් සූරා කෑම සඳහා වාසිදායක ම තත්ත්වයන් තහවුරු කර ගැනීම ද වෙයි.

මෙම ආත්මාර්ථකාමිත්වය වෛෂයිකව මුල් බැස ගෙන ඇත්තේ, වැටුප් ශ්‍රමයෙන් අතිරික්ත වටිනාකම මිරිකා ගැනීම මත, එනම් කම්කරු පන්තිය යටත් කර තබා ගැනීම මත පදනම් වන පන්තියක් ලෙස ධනේශ්වරයෙහි ස්වභාවය තුල ය. එල්ටීටීඊය වැනි ධනේශ්වර ජාතිකවාදයේ ඉතා ම රැඩිකල් ප්‍රවනතාවන් ද ඇතුලු සියලු ම කොටස්වල පිලිවෙත් මෙම පන්ති අරමුන විසින් මෙහෙයවනු ලැබෙයි. එය එම ප්‍රවනතාවන්හි දේශපාලන දේහ-ව්‍යුහය ද නිර්නය කරයි. සෑම අවස්ථාවක දී ම ධනේශ්වර ජාතිකවාදියෝ, විමුක්ති අරගලය "සිය අත යටින් ඉවතට ගොස්" ධනේශ්වර පාලනය පවත්වා ගෙන යාමට තර්ජනයක් බවට පත් වීම වලක්වා ලීමට වග බලා ගනිති.

9. පීඩිත ජනතාව බලමුලු ගැන්වීම සීමා කර ගන්නා වූ පීඩිත රටවල හා පසුගාමී රටවල ධනේශ්වර පන්තිය, තම ජාතීන් අධිරාජ්‍යවාදී පීඩනයේ නිය පඳුරින් ගලවා ගැනීම සඳහා අත්‍යවශ්‍ය පූර්වාවශ්‍යතාව වන ප්‍රජාතන්ත්‍රවාදී විශ්ව සාධාරනත්වය අත් කර ගැනීමට ඓන්ද්‍රියව ම අසමත් වෙති. ඔක්තෝබර් 16 දින කම්කරු මාවත පත්‍රයෙන් විප්ලවවාදී කොමියුනිස්ට් සංගමය නිවැරදිව ප්‍රකාශ කල පරිදි:

"එහෙත් **ජාතික සුවිශේෂතාවාදය** පදනම් කර ගෙන, තමන්ගේ පමනක් අයිතීන් පතා ගොඩ නගන ව්‍යාපාරයක් මගින් ජාතික විමුක්තිය ලැබිය නොහැකි ය. අප ජීවත් වන මෙම කාලයේ දී, එබඳු ව්‍යාපාරයක් කොතෙක් ප්‍රබල මහජන ව්‍යාපාරයක් ජනනය කලත් එය සතුරු ධනපති රාජ්‍යයන් පෙලක් මැද තනි වන්නේ ය. සුවිශේෂ පීඩිත ජාතියක විමුක්ති ව්‍යාපාරයක් පෙරට යා හැක්කේ, ප්‍රජාතන්ත්‍රවාදය සඳහා නිරවශේෂව ද පුලුල්ව ද සටන් වදින ව්‍යාපාරයක කොටසක් ලෙස පමනකි. ජාතික සුවිශේෂතාවාදය, පීඩිත ජාතියක ජාතික විමුක්ති අරගලය එබඳු ව්‍යාපාරයක කොටසක් බවට පත් වීම වලකයි. එසේ වන්නේ ජාතික සුවිශේෂතාවාදය, අවසන් විග්‍රහයේ දී, ජාතික ධනපතියන් තමන්ගේ ම රටේ කම්කරුවන් සූරා කෑමටත් ගොවීන් ගසා කෑමටත් දරන පරිශ්‍රමයකට සම්බන්ධ වී ඇති හෙයිනි. දෙමල ඊලම් විමුක්ති කොටි සංවිධානයේ දේශපාලන බෙලහීනත්වය ගලා එන්නේ එතැනිනි."

10. ඉන්දු-ලංකා ගිවිසුම පිලිගැනීමේ ඛේදජනක ප්‍රතිවිපාක (ඉන්දියානු හමුදාවන් කර ගෙන යන භයංකර ජන ඝාතනය ද මීට ඇතුලත් ය) නො තකා ම එල්ටීටීඊ සංවිධානය දැනුදු යත්න දරන්නේ ගාන්ධි සමග තමන් ඇති කර ගත් දැන් සුන් වී ඇති සන්ධානයේ කැබලිත්තකට හෝ එල්බී ගැනීමට ය. ඉන්දියානු හමුදාවේ ජන ඝාතක ක්‍රියාවන් සාවද්‍ය අවබෝධයක ප්‍රතිඵලයක් ය යි ඔක්තෝබර් 14 දින තරම් මෑතක දී ප්‍රභාකරන් කියා සිටියේ ය. හේ ගාන්ධිට යැවූ පනිවුඩයක මෙසේ සඳහන් කලේ ය: "ඉන්දියාව වැනි ප්‍රජාතන්ත්‍රවාදී රටක්, සිය දේශපාලන ඉරනම තීන්දු කර ගැනීමට ප්‍රජාතන්ත්‍රවාදී නිදහස ඇත්තා වූ ජනතාවක් මත තම අභිමතය ආරෝපනය කිරීමට මැදිහත් වීම ඉන්දියාවේ තරමට නො ගැලපේ." ප්‍රභාකරන් ඉන්දියානු "ප්‍රජාතන්ත්‍රවාදයට" කරන යාදින්නට දිය හැකි හොඳ ම අර්ථය නම් එය බොලඳත්වයේ ප්‍රකාශනයක් බව ය. නරක ම අර්ථයෙන් නම් එය වනාහි දෙමල ජනතාව දැනුවත්ව රැවටීමකි. එහි අරමුන වන්නේ කොලඹ, නව දිල්ලිය සහ යාපනයේ තම පන්ති සතුරාට විරුද්ධව කම්කරුවන් හා ගොවීන් ස්වාධීනව බලමුලු ගැන්වීම වැලැක්වීම යි.

11. එල්ටීටීඊ සංවිධානය ලත් අසාර්ථකත්වය ජාතික ස්වයං නිර්නය අයිතිය සඳහා ඉල්ලීම අවලංගු නො කරයි. එපමනක් නො ව එය එබඳු අරගලයක් නිරර්ථ ය යි තහවුරු කිරීමක් ද නො කරයි. නැවතත් වරක් ඉන් තහවුරු වන්නේ, ජාතික ප්‍රජාතන්ත්‍ර ව්‍යාපාරයේ ඉරනම පීඩිත රටේ කම්කරු පන්තියේ ඓතිහාසික කාර්ය භාරය සමග බැඳී ඇති බව යි. ප්‍රජාතන්ත්‍ර විප්ලවයේ අනෙකුත් නොවිසඳුනු කර්තව්‍යයන් මෙන් ම ජාතික ස්වයං නිර්නය ද අත්පත් කර ගත හැක්කේ නිර්ධන පන්ති ඒකාධිපතිත්වය තුලින් පමනකි. සැබවින් ම, හතර වන ජාත්‍යන්තරයේ මෙම ඓතිහාසික ඉදිරි දර්ශනය දෙමල හා සිංහල ශ්‍රී ලාංකික ජනයාගේ 40 අවුරුදු අත්දැකීම තුලින් ඛේදජනකව තහවුරු වී ඇත. පැබ්ලෝවාදී සංශෝධනවාදීන්ගේ පිටුබලය ලැබ ලංකා සමසමාජ පක්ෂය පසු ගිය 25 වසර තුල කල කිව නොහැකි තරම් කැත පාවා දීම නොවන්ට දෙමල ජාතික අරගලය සහ ශ්‍රී ලංකාවේ කම්කරු පන්තියේ පන්ති අරගලය දෙකඩ නොවන්ට තිබුනි. 1964 දී ලසසපය බන්ඩාරනායක සභාගයට ඇතුලු වීම පන්ති අරගලයේ මෙන් ම ජාතික ව්‍යාපාරයේ ද වර්ධනයෙහි ඓතිහාසික බෙදුම් කඩනයක් සලකුනු කලේ ය. එම ඓතිහාසික පාවා දීමට පෙර දෙමල ජනතාව කම්කරු පන්තියෙන් නායකත්වය බලාපොරොත්තු වූ අතර, කම්කරු පන්තිය ශ්‍රී ලංකාවේ ධනපතියන් පෙරලා දැමූ පසු ජාතික පීඩනය ඉවත් කෙරෙනු ඇතැයි ඔවුහු විශ්වාසවන්තව අපේක්ෂා කලහ. 1953 හර්තාලයෙන් ද 1963-64 ඉල්ලීම් 21 ව්‍යාපාරයෙන් ද මෙය ද්‍රව්‍යමයව පැහැදිලි විය. මුලු තත්ත්වය ම 1964-72 අතරතුරේ දී වෙනස් විය. ලසසපය සිංහල ධනේශ්වර රාජ්‍යය රැක දීමේ වගකීම භාර ගනිමින් ජාතික පීඩනය සංස්ථාගත කලා වූ ව්‍යවස්ථාවක් සම්මත කිරීමට කෙලින් ම සහභාගි විය. ලසසප විසින් අතරමං කර දමනු ලැබූ දෙමල ජනතාව නව මාවතක් සොයා ගියෝ ධනේශ්වර ජාතිකවාදී දේශපාලනයේ පසුකඩට උකහා ගනු ලැබූහ.

12. ලසසපයේ පාවා දීම තිබුනේ වී නමුදු, ධනේශ්වර ජාතිකවාදයේ වංකගිරියෙන් එලියට ආ හැකි එක ම මග වන්නේ දෙමල හා සිංහල කම්කරු පන්තියේ ඒකාබද්ධ අරගලය මත පදනම් වූ මාවතකි. දෙමල ජාතිය මෙන් ම දකුනු පලාත්වල සිංහල මහජනතාව ද පීඩාවට ලක් කරන්නා වූ පන්ති පදනම කුමක් දැයි එලි කර ඇති ඉන්දියානු ආක්‍රමනය, සිංහල හා දෙමල කම්කරු පන්තියේ ආධිපත්‍යය යටතේ ජාතික අරගලය පන්ති අරගලය සමග ඒකාබද්ධ කිරීමේ විධානය යලි නවමුව ඉස්මතු කර ඇත. මින් සංයුක්තව අදහස් වන්නේ **දෙමල ඊලම්හි ද ශ්‍රී ලංකාවේ ද සමාජවාදී එක්සත් ජනපදයක්** පිලිබඳ ධජය ඔසොවා ලීම ය.

13. ධනේශ්වර රාජ්‍යයන්ගේ කුනු වන ව්‍යුහය මත ද ඔවුන්ගේ කෘත්‍රිම දේශ සීමා නමැති ගෙල හිර කරන්නා වූ සීමාවන් තුල ද ජනතාවගේ ප්‍රජාතන්ත්‍ර අපේක්ෂාවන් වත් මූලික ද්‍රව්‍යමය උවමනාකම් වත් සන්තර්පනය කල නොහැකි ය. දෙවන ලෝක යුද්ධයෙන් පසුව අධිරාජ්‍යවාදය විවිධ භාෂාත්මක, ආගමික හා වාර්ගික සංරචකයන්ගේ සැබෑ ප්‍රජාතන්ත්‍රවාදී එකමුතුව මත පදනම් වූ එකදු ජාතික රාජ්‍යයක් වත් නිර්මානය කිරීමට ඉඩ නොදුන්නේ ය. අධිරාජ්‍යවාදයේ අනුමැතිය ලත් " ස්වාධීනත්වයේ" අර්ථය වූයේ අනිවාර්යයෙන් ම ප්‍රජාතන්ත්‍ර මූලධර්ම මාරක ලෙස උල්ලංඝනය කිරීම මත පදනම් කරනු ලැබූ අවජාතක රාජ්‍යයන් බිහි කිරීම ය. මෙම ක්‍රියා දාමයේ දී ජාතික ධනේශ්වර පන්තිය ක්‍රියා කොට ඇත්තේ පීඩිත ජනතාවගේ විමුක්තිදායකයා ලෙස නො ව අධිරාජ්‍යවාදී කොල්ලයේ කනිෂ්ඨ හවුල්කරුවා ලෙස ය. මෙම ක්‍රියාවලිය තුල දී නිර්මානය කරනු ලැබූ රාජ්‍ය වර්ගය නිෂ්පාදන බලවේගයන්ගේ ප්‍රගතිශීලී වර්ධනයක් ඇති කිරීමට අසමත් වූ කුනු වන ධනවාදයේ සිපිරි ගිමක් මැ වී ය.

14. මෙම ධනේශ්වර රාජ්‍ය තුල අධිරාජ්‍ය ආධිපත්‍යයේ විපාක මොනවට පැහැදිලි ය. පවත්වා ගෙන යා හැකි වූ දේශීය කර්මාන්ත වර්ධනය කිරීමට අසමත් වූ මෙම රාජ්‍යවල ආර්ථික ඉරනම අමුද්‍රව්‍ය කිහිපයක් නිර්යාත කිරීමට ගැට ගැසී ඇත, මෙම රාජ්‍යයෝ දැවැන්ත හා නො ගෙවිය හැකි නයක් යටතේ හුස්ම හිර වී මිය යමින් සිටිති. මෙම පසුගාමී රටවල මහා පරිමාන අකුරු නොදත් බව, ලෙඩරෝග හා හාමත භයංකර ලෙස සන්නිපාතව ඇත. ප්‍රාදේශීය කර්මාන්ත ගොඩ නැගී ඇති විරල අවස්ථාවල පවා ඒවා ගොඩ නැගී ඇත්තේ අධිරාජ්‍ය-පාලිත බහුජාතික නිෂ්පාදනයේ කොටසක් හැටියට අධිරාජ්‍ය සුපිරි ලාභවල උල්පත් ලෙස සුවිශේෂයෙන් ම යොදා ගනු ලබන ආකාරයට ය. මෙබඳු ව්‍යාජ ආර්ථික වර්ධනයක් පීඩිත ජනතාවගේ ජාතික අවශ්‍යතාවන් කිසිදු ලෙසකින් අත් කර නො දෙයි. මෙබඳු තත්ත්වයන් තුලින් පැන නගින්නේ ධනපති පන්තියේ විකෘත ප්‍රීතියට හේතුභූත වූ අන්තර් වාර්ගික යුද්ධයන් ය. ධනේශ්වර පාලනය පවත්නා තාක් මෙම තත්ත්වය වෙනස් කල නොහැකි ය. ඉන්දියාව, පකිස්ථානය, ශ්‍රී ලංකාව, බංග්ලාදේශය, බුරුමය - සත්තකින් ම ලෝකයේ සැම පැරනි විජිත රටක ම - ඊනියා ස්වාධීනතාවෙන් පසු ඉතිහාසය විසින් තීරනාත්මකව ඔප්පු කෙරී ඇත්තේ, සැබෑ ජාතික එකමුතුවක් ස්ථාපනය කිරීමට හෝ දේශපාලන ස්වාධීනත්වය ලබා දීමට ධනේශ්වර පන්තිය අසමත් බව ය.

15. ස්ටැලින්වාදීන්, සංශෝධනවාදීන් හා සුලු ධනේශ්වර ජාතිකවාදීන් කුමක් කීවත්, ඉතිහාසය මෙම කර්තව්‍යය භාර දී තිබෙන්නේ නිර්ධන පන්තියට ය. ස්වයං නිර්නය සඳහා ජාතීන්ගේ අයිතිය සාක්ෂාත් කර ගත හැකි එක ම සමාජ බලවේගය නිර්ධන පන්තිය යි. එහෙත් නිර්ධන පන්තිය මෙය ඉටු කරන්නේ ජාතික ධනේශ්වරයේ වලිගයක් හැටියට නො ව, එහි සම්මුති විරහිත සතුරෙකු හැටියට ය. නිර්ධන පන්තිය ජාතීන්ගේ ස්වයං නිර්නය අයිතිය සඳහා සටන් වදින්නේ තමන්ට ම ආවේනික වූ අවිවලිනි; තමන්ගේ ම ක්‍රියා මාර්ගය මත ය; ගමේ හා නගරයේ සියලු පීඩිත ජනතාව තමන් පිටුපස බලමුලු ගන්වා ගනිමිනි. ජාතික ස්වයං නිර්නය අයිතිය තහවුරු කෙරෙනවා ඇත්තේ සිය ඒකාධිපතිත්වය පිහිටුවා ගෙන සියලු ම පීඩිත ජනයාට ඔවුන්ගේ යුක්ති යුක්ත ප්‍රජාතන්ත්‍ර අයිතීන් සහතික කරන්නා වූ, කම්කරු පන්තිය විසින් නායකත්වය දෙනු ලබන සමාජවාදී විප්ලවයේ අතුරු ඵලයක් ලෙස ය. ජාතීන් අතර සැබෑ සමානත්වයේ රාමුවක් ලෙස සිය කැමැත්තෙන් එක්සත් වූ සමාජවාදී සමූහාන්ඩුවක් නිර්මානය කිරීමට නිර්ධන පන්තිය යෝජනා කරයි. ආර්ථික හා සංස්කෘතික ප්‍රගමනය සඳහා හොඳ ම අවස්ථාව සහතික කෙරෙන්නේ සියලු ම පීඩිත ජාතීන්ගේ ස්වේච්ඡා ඒකාබද්ධතාවෙන් ය යි විශ්වාස කරන අතර ම, නිර්ධන පන්ති ඒකාධිපතිත්වය, වෙන් වීමට කැමති සැම ජාතියකට ම වෙන් වීමට ඇති අයිතිය සහතික කර දෙන්නේ ය. දෙමල ඊලම් හා ශ්‍රී ලංකාව අතර එක්සත් සමාජවාදී රාජ්‍යයන්ගේ සමූහාන්ඩුවක් සඳහා විප්ලවවාදී කොමියුනිස්ට් සංගමය විසින් ඉදිරිපත් කරනු ලැබ ඇති ක්‍රියා මාර්ගයේ සාරභූත අන්තර්ගතය මෙය යි.

16. මෙම අරගලයට ඇති ප්‍රධාන බාධකය නම් ලසසපය සහ ස්ටැලින්වාදීන් ඉන්දියානු හා ශ්‍රී ලාංකික පාලක පන්තීන් සමග පවත්වා ගෙන යන්නා වූ දුෂ්ට සහයෝගය යි. ඔවුන් ජයවර්ධන පාලනය සමග ක්‍රියාත්මකව පවත්වා ගෙන යන සහාගය වනාහි ඔවුන් විසින් ඒකීය රාජ්‍යය රකිනු ලැබීමේ අනිවාර්ය ප්‍රතිඵලය යි. මෙම පක්ෂ දෙකින් එකකට හෝ ධනේශ්වරයෙන් මොන ම ස්වාධීනත්වයක් වත් ඇත්තේ නැත. කොපයේ ක්‍රියා කලාපය ස්ටැලින්වාදයේ මුලු මහත් ඉතිහාසය

තුල ම ගැබ් වී ඇත. ලසසපය ගත හොත්, එය සිය විප්ලවවාදී අතීතය සමග සියලු ඓතිහාසික සබඳතා බිඳ දමා ඇත. දැවැන්තයන් ඇද වැටී ඇති සැටි! ජාතික ප්‍රශ්නය ගැන කොල්වින් ද සිල්වා විසින් ලියන ලද මාක්ස්වාදී සාහිත්‍යයේ සැබෑ අග්‍රගන්‍ය කෘති වශයෙන් නම් කල හැකි අතීත ලියවිලි දැන්, ඔහු තව මත් නායකත්වය දරන පක්ෂයේ සමස්ත දේශපාලන පිලිවෙතට එරෙහිව එසවූ චෝදනා ගුලියක් වැන්න! ලසසප රිය යූඇන්පී ගොනුට බැඳ දමා ඇති කොල්වින් ද සිල්වා එමගින් දිවයිනේ අතිශය ප්‍රතිගාමී ජාත්‍යෝත්තමවාදී බලවේගයන්ට දොර හැර දී ඇත. සිංහල රාජ්‍යය රැක දීමට කිසිදු උවමනාවක් නැති කම්කරු පන්තියේ කැමැත්තට එරෙහිව ලසසපය ජයවර්ධන පාලනයේ දුෂ්ටතම අපරාධවල වගකීමට කර ගසා සිටිති.

17. එපමනක් නො ව, උතුරේ හා නැගෙනහිරේ ඉන්දියානු වාඩි ලා ගැනීම අනුමත කිරීම මගින්, ලසසපය පීඩිත සිංහල ගොවියන්ගේ යුක්ති යුක්ත ජාතික හැඟීම් ඉවබවකින් තොරව නො තකා හරිමින් අතිප්‍රතිගාමී ජවිපෙහි ද එහි ශ්‍රීලනිප ගුරාලාගේ ද හස්තය ශක්තිමත් කරයි. මෙම පිලිවෙත උදව් වන්නේ සුලු ධනේශ්වර ජනයාගේ ඇස් ඉදිරිපිට කම්කරුවන්ගේ ව්‍යාපාරය අපකීර්තියට පත් කිරීමට ය; සිංහල ජාත්‍යෝත්තමවාදය මත පදනම් වූ ෆැසිස්ට් ව්‍යාපාරයක් වර්ධනය කිරීමට ආධාර කිරීමට ය. ඉන්දියානු ආක්‍රමනයට විරුද්ධ අරගලය ශ්‍රී ලාංකික ධනේශ්වරයට එරෙහි පන්ති අරගලය සමග අනන්‍ය කර ගන්නවා වෙනුවට, සහ ඊට අමතරව, මෙම පන්ති අරගලය සිංහල-දෙමල ජනතාව ප්‍රජාතන්ත්‍රවාදීව එක්සත් කිරීම සමග බද්ධ කරනවා වෙනුවට, ලසසපය පීඩිත ජනතාවගේ සියලු කොටස් (කම්කරු පන්තියෙන්) ඈත් කර ලීමට හැකි සෑම දෙයක් ම කරයි. එය ඉන්දියානු ආක්‍රමනය වග වර්නනා කරයි; දෙමල ජනතාව සමූලෝත්පාථනය කිරීමට සහයෝගය දෙයි; දකුනු පලාත්වල ජයවර්ධනගේ මර්දනකාරී පියවරයන්ට අනුකුලත්වය පුදයි. ලසසප පිලිවෙත්වල නාභිය වන්නේ සමාජවාදී හා ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියා මාර්ගයක් උඩ කම්කරු පන්තිය ස්වාධීනව බලමුලු ගැන්වීම ප්‍රතික්ෂේප කර ලීම ය.

18. සිද්ධීන්ගේ මුලු මහත් ගමන් මග ම විප්ලවවාදී කොමියුනිස්ට් සංගමයේ ක්‍රියා මාර්ගය සනාථ කර ඇත. එය පමනක් ම උතුරේ දෙමල කම්කරුවන් හා දකුනේ සිංහල කම්කරුවන් අතර කම්කරු පන්තික ජාත්‍යන්තරවාදයේ මූලෝපාය සඳහා සටන් කර ඇත. එතකුදු නො ව, පසු ගිය වසර තුල ඉන්දියාවේ සෝශලිස්ට් ලේබර් ලීගය සමග සමීප සහෝදර සහයෝගිතාවකින් යුතුව, ට්‍රොට්ස්කිවාදී පිලිවෙත් සඳහා අරගලය විකොස විසින් ඉන්දියාවේ කෝටි සංඛ්‍යාත කම්කරු පන්තිය තුලට විහිදුවනු ලැබ ඇත. මෙම පියවර ද ගන්නා ලද්දේ ඉන්දියානු හා ශ්‍රී ලාංකික කම්කරු පන්තීන්ගේ ඉරනම අවියෝජනීය ලෙස එකට බැඳී ඇති බව හා අධිරාජ්‍යවාදයට විරුද්ධ ඔවුන්ගේ අරගලය ඒකාබද්ධ අරගලයක් ය යන්න මත පදනම් වූ දැනුවත් තීන්දුවක් මත ය.

19. වත්මන් තීරනාත්මක මොහොත තුල විකොස ඉදිරියේ ඇති හදිසි කර්තව්‍යය වන්නේ තම බලවේගයන් හැකි තාක් වේගවත්ව ප්‍රසාරනය කිරීම යි. මේ සඳහා ලසසප-කොප දෙක ම යූඇන්පිය සමග ගෙන යන්නා වූ සහයෝගයට එරෙහි අරගලය තීව්‍ර කිරීම අත්‍යවශ්‍ය ය. විකොස නිරවද්‍යව මෙසේ පවසා ඇත:

"ඉන්දු-ලංකා ආක්‍රමනික හමුදා උතුරු-නැගෙනහිර පලාත්වලින් වහා ඉවත් කරන ලෙසත් දෙමල ජාතියේ ජාතික ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය තහවුරු කිරීමටත් උද්ඝෝෂනය කරමින් සිංහල හා දෙමල කතා කරන ජනතාවන්ගේ සමාජවාදී සමූහාන්ඩුවක ඉදිරි දර්ශනය මත යූඇන්පී ආන්ඩුව පලවා හැරීමටත් කම්කරු-ගොවි ආන්ඩුවක් බලයට ගෙන ඒමටත් කම්කරු පන්තිය ධනපති පක්ෂවලින් ස්වාධීනව බලමුලු ගැන්වීමට සටන් කිරීම එක ම ඉදිරි මාවත වේ."

20. මෙම අරගලයේ තීරනාත්මක අංගයක් ලෙස, ධනේශ්වර පන්තියට හා යූඇන්පී පාලනයට එරෙහිව පැන නගින සෑම කම්කරු පන්තික අරගල රූපයක් මුදුනෙහි ම පිහිටා සිටීමට විකොස සටන් වැදිය යුතු ය. ලෝකය පුරා සංශෝධනවාදීන් විසින් අමතක කර දමනු ලැබ ඇති බලවේගය වන ශ්‍රී ලංකාවේ කම්කරු පන්තියේ නව ප්‍රහාරයක් ලෝක ආර්ථිකයේ වර්ධනය වන අර්බුදය මගින් ඉදිරි මාසවල දී අවුලුවා ලනු ඇත. ලඟා වන මෙම ප්‍රහාරය නිවැරදි විප්ලවවාදී පිලිවෙතක් මගින් සන්නද්ධ කරනු ලැබුව හොත් ශ්‍රී ලංකාවේ ද ඉන්දියානු උපමහාද්වීපයේ ද මුලු මහත් දේශපාලන බල තුලනය ප්‍රතිවර්තනය කෙරෙනු ඇත. ලසසප-කොප පාවා දීම ද ග්‍රාමීය ජනතාවගේ වික්ෂෝභය ද මත පදනම්ව ජනතා විමුක්ති පෙරමුන පිටිසර පලාත්වල ලබා ගෙන ඇති තත්ත්වයට ද, කම්කරු පන්තියේ නැගිටීම විසින් සිංහල ගොවි ජනතාවට නව ඉදිරි දර්ශනයක් සැපයෙත් ම, වල කැපෙනු ඇත.

21. හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව, විප්ලවවාදී කොමියුනිස්ට් සංගමය පසු ගිය මාස කිහිපය තුල බලවත් ආයාසයකින් දිනා ගෙන ඇති වැදගත් ජයග්‍රහන ඉමහත් සතුටකින් සනිටුහන් කර ගනී. ආන්ඩු මර්දනයට ද සිංහල මැර කන්ඩායම්වලට පහරට ද මුහුන දී ගෙන, ඉන්දු-ලංකා ගිවිසුමට විරුද්ධව කම්කරු පන්තියේ නාමයෙන් උද්ඝෝෂනය කලේ විප්ලවවාදී කොමියුනිස්ට් සංගමය පමනි. සියලු දුෂ්කරතාවන්ට මුහුන දී කොලඹ, මහනුවර

හා යාපනයේ දී එය ඉන්දු-ලංකා ගිවිසුමට එරෙහිව පැවැත්වූ ප්‍රසිද්ධ රැස්වීම් පැහැදිලිව ම පෙන්නුම් කරන්නේ, දකුනු ප්‍රදේශවල ලසසපය හා කොපය ද උතුරේ එල්ටීටීඊය ද වෙතින් ඉවතට බලවේග දිනා ගැනීමේ මාවතට එය පිවිස සිටින බව යි. විප්ලවවාදී කොමියුනිස්ට් සංගමයේ ප්‍රධාන ලේකම්වරයාගේ සොහොයුරා ද ඇතුලු පක්ෂයේ ප්‍රධාන සහෝදරයන් තිදෙනෙකු ඝාතනය කිරීමට නොවැම්බර් 12 දා කොලඹ දී යූඇන්පිය දැරූ ප්‍රයත්නය පසුපස පවතින්නේ නිශ්චිතව ම මෙම ජයග්‍රහනයන් ය. කම්කරු පන්තිය තුල සහ තරුනයන් අතර ට්‍රොට්ස්කිවාදයේ අනුහස පැතිරීම පිලිබඳව ශ්‍රී ලංකාවේ ධනේශ්වර පන්තිය පත් වී ඇති භීතිය පිලිබඳ තවත් ඇඟවීමක් නම් ජවිපෙ විසින් මෑත දී විකොස සාමාජිකයන්ට එරෙහිව දියත් කරනු ලැබ ඇති මරන තර්ජනයන් ය. මෙම තර්ජනයන්ට එරෙහිව අවශ්‍ය ආරක්ෂක පියවරයන් මගින් ද, අන් සියල්ලට මත් වඩා කම්කරු පන්තිය තුල එය කර ගෙන යන විප්ලවවාදී වැඩ තීව්‍ර කිරීම මගින් ද මෙම පිලිතුර දිය යුතුව ඇත.

- දෙමල ඊලම් දේශයෙන් ඉන්දියානු හමුදා ඉවත් කරනු! දෙමල විමුක්ති අරගලයට අත නො තබනු!
- ගාන්ධි-ජයවර්ධන ගිවිසුම භංග වේවා!
- දෙමල ඊලම් හා ශ්‍රී ලංකා සමාජවාදී එක්සත් ජනපදයක් සඳහා සිංහල-දෙමල කම්කරුවන් එක්සත් කරනු!
- සිංහල හා දෙමල කම්කරු පන්තියේ පෙරටු බලඇනිය වූ විප්ලවවාදී කොමියුනිස්ට් සංගමය දිනේවා!
- හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව දිනේවා!

© www.wsws.org